# අකීකරු කොටි පැංචා



විමාෂා ගිම්හානි

# අකීකරු කොටි පැංචා

එල්.කේ.විමාෂා.ගිම්හානි

2023.10.29

# පිදුම

මගේ පන්ති භාර ගුරුතුමියට ආදරයෙන් පුදමි

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් ඵලදායි පුරවැසියෙකු සතුටින් ජීවත්වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන්ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩ නැගීම අපේක්ෂාවයි එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත්කිරීම තුළින් ගෝලීය සමාජයට ගැළපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි එම ජාතික අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගණනාවක් සිට විවිධ අරමුණු පෙරදැරිකොට ගෙන ග්‍රන්ථකරණයට යොමුකිරීමේ ප්‍රතිඵලයක් ලෙස දේශිය සාහිත්‍ය කෙතේ ලේඛක අංකුර දහස් ගණනක් වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරාලීමකි

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවීමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවනට ගැළපෙන ලෙස නවීකරණයකරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදි දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙන්ම ගත්කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේම පාසල් දරුවන් අතර විද්‍යුත් පොතක් ලියන්නට සිහින දකින දරුවන් සහෝදරත්වයෙන් අප හා එක්වීම අගයකරමි

2023 සාහිත්‍ය මාසයට සමගාමීව අප පාසල විසින් සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක් "ව්‍යාපෘතිය එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලැබුන අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවායි ප්‍රාර්ථනා කරමු

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහාය දැක්වූ අප පාසලේ කළමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමුකළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උදව් උපකාර කළ සැමට හෘදයාංගම ස්තූතිය මෙමගින් පිරිනමමි

මෙම ව්‍යාපෘති යෝජනාව ඉදිරිපත්කරමින් එයට ජීවයක් වූ සෙනෙවිරත්න මහලේකම්ගේ සේවය ද අගයමි

ශෂිකලා සේනාධීර

විදුහල් පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය - මහනුවර

2023 10 20

ඔන්න එකෝමත් එක කැලෑවක ජීවත් උනා පුංචි කොටි පවුලක්. ඒ කොටි පවුලේ හිටියා කොටි අම්මෙකුයි කොටි තාත්තෙකුයි පුංචි කොටි පැටියෙකුයි ..



මේ පුංචි කොටි පැටියගේ නම තමයි සිම්බා. හැබැයි මේ සිම්බා නම් අම්මයි තාත්තයි කියන දේ පොඩ්ඩක්වත් අහන්නේ නෑ. හරි ම දඟයි



එක දවසක් උදේම අම්මයි තාත්තයි එලියට ගියා. දැන් ඉතින් ගුහාවේ කවුරුවත් නැනේ සිම්බාට හරිම කම්මැළි. ඔන්න එතකොට ම පුංචි සමනලයෙක් සිම්බා ලගට ආවා.සිම්බා එයාව අල්ලන්න ලගට පැන්නා ඒත් අල්ල ගන්න බැරි උනා සමනළයා කැලෑව ඇතුළට පියැඹුවා සිම්බාත් ඒ පස්සේ ම කැලේ ඇතුළට දිව්වා.



සිම්බා දන්නේම නැතුව කැලේ මැද්දට ම ආවා. සමනළයා ඈතට පියාඹලා ගියා. සිම්බා වටපිට බැලුවා. ඒත් එයාට ගෙදරට යන පාර නම් හොයා ගන්න බැරි උනා. හැමතැන ගස්. සිම්බා හොඳටම බය උනා.



සිම්බා කැලේ මැද තනියම ඉද්දී. පුංචි අලි පැංචෙක් ඇවිත් ඇහුවා ඇයි ඔයා කැලේ මැද තනියම ඉන්නේ? එතකොට සිම්බා මං සමනලයෙක් පස්සෙන් ආවේ මම දන්නේම නැතුව කැලේ මැද්දට ම ඇවිත් මට දැන් ගෙදර හොයා ගන්න බෑ.



ඉතින් අලි පැටියටත් දුකයි මේ සිම්බා ගැන.යාලුවේ මං ඔයාට ගෙදර හොයා ගන්න උදව් කරන්නම්.අනේ ඔයාට ගොඩාක් ස්තුතිය යාලුවේ! සිම්බාටත් හරිම සතුටුයි.ඊට පස්සේ ඉතින් මේ යාලුවො දෙන්නා සිම්බා ආපු පාර දිගේම  සිම්බාගේ ගෙදර හොයන් ගියා...



ඉතින් කොහොම හරි මේ යාලුවො දෙන්නා සිම්බාගෙ ගෙදර හොයා ගත්තසිම්බා නැති නිසා අම්මායි තාත්තයි කැලේ සත්තු එක්ක සිම්බාව හොයන්න කතා වෙනවා...



දැන් ඉතින් සිම්බා ගෙදර හොයා ගත්තා නේ. සිම්බා දැක්කා අම්මායි තාත්තයි හොදටම බය වෙලා කැලේ සත්තු එක්ක ඉන්නවා. සිම්බා දුවගෙන ගියා අම්මායි තාත්තයි ලගට. ඊට පස්සේ වෙච්ච දේවල් ඔක්කොම කියලා සමාව ගත්තා.



ඊට පස්සේ කොටි අම්මයි තාත්තයි අලි පැංචාට ස්තුතිය කලා. සිම්බා කිව්වා ආය කවදාවත් අම්මයි තාත්තයි එපා කියන දේ කරන්නේ නෑ කියලා. එදා ඉදන් සිම්බා කිසිම දග වැඩක් කලේ නෑ. ඉතින් මේ පුංචි කොටි පවුලත් හරිම සතුටින් ජීවත් උනා....

ආදර්ශය- දෙමාපියන් එපා කියන දේ කවදාවත් කරන්න එපා



පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීපකරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇතිකිරීම ඔවුන්ගේ සාහිත්‍යය නිර්මාන හැකියාවන් ඔප්නංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝදයක් ඇතිකිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දී මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හඳුන්වාදෙන ලදී ඒ යටතේ වැඩිම ග්‍රන්ථ ප්‍රමානයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහාමායා ප්‍රංචි ගත්කතුවරියන්ය පාසල තුළ ගොඩනැගී ඇති ලේඛණ සංස්කෘතිය නව මාවතකට යොමුකරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලඟාවීමට නූතන තාක්ෂණය හා බැඳුනු විද්‍යුත් කෘති රචානා කරන්නට විය ඒ තුළින් සම්පාදනවූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබාදෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල්වන අතරම ඔවුන්ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි මෙම නිර්මාන රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මගපෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැළසුම්කරුවන්ට මෙන්ම සමාජයේ වගකිවයුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි පාසල් මට්මින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද සංකල්ප මංකොල්ලයන්ට හසුවෙමින් පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහාමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත්කරමි

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහාමායා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් රචනාකර ජනගතකරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත්කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමි

මෙයට

සෙනෙවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාතෘ

2023 10 20